**බුද්ධශාසන අරමුදල - 2018**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බුද්ධශාසන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---------------------------------------------------------------------

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) මුදල් ගෙවීම් | 1,717,000 | ගෙවීම් ලබා ගත් බවට කුවිතාන්සි | සඳහන් කර ඇති මුදලට අදාලව පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවීම් සම්බන්ධයෙන්, අදාල මුදල ලබා ගත් බවට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) බැරකම් | 1,348,796 | විස්තරාත්මක තොරතුරු | 2015 වර්ෂයේ අවසන් ගිණුම්වල ඉදිරියට ගෙන ආ අගයන් වන අතර මේ වන විටත් වෙනසක් සිදුවී නැත. | විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.13,031,828 ක් වූ අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් වයස් විශ්ලේෂණ නොමැති | ශේෂවල වෙනසක් සිදු වී අතර මේ | අදාල ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කර නොතිබුණද, ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව රු. 1,087,447 ක් වර්ෂ 06 කට සහ ඉතිරි රු. 11,944,381 ක් වර්ෂ 03 කට වඩා පැරණි ශේෂ බව අනාවරණය වූ අතර, එම ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා පාලක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුව ඇත. | යුතු බව. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 1,712,435 ක් වූ ජංගම වගකීම් ශේෂ දෙකක් සම්බන්ධයෙන් වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණද, ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව රු. 544,409 ක් වර්ෂ 04 කට සහ ඉතිරි රු. 1,168,025 ක් වර්ෂ 03 කට වඩා පැරණි ශේෂ වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂවල වෙනසක් සිදු වී නොමැති අතර මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා පාලක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුව ඇත. | අදාල ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

--------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 396 | 2013 සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ දී අරමුදල විසින් නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකරන ලද එකතුව රු. 56,863 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට මෙම වාර්තාවේ දිනය වන විටත් පියවර ගෙන නොතිබුණි. | චෙක්පත් සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් වෙත දැනුවත් කිරීම සඳහා ලිපි නිකුත් කර ඇති අතර වෙනත් කිසිදු තීරණයක් ගෙන නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ii) මුදල් රෙගුලාසි 502 (2) | එකතුව රු. 10,213,031 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | 2018 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන ගොස් නැති අතර 2020 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| (iii) මුදල් රෙගුලාසි 757 (2) | වටිනාකම රු. 8,652,506 ක් වූ බෞද්ධ ධර්ම ග්‍රන්ථ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2015 වර්ෂයේ අවසන් ගිණුම්වල ඉදිරියට ගෙන ආ අගයන් වන අතර මේ වන විටත් වෙනසක් සිදුවී නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මගින් ඇතුළත් කරන ලද මුදල් රෙගුලාසි 877(2) (ඇ) රෙගුලාසිය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ දෙකකුත් මාස 08 ක කාල පමාවකින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | 2016, 2017 සහ 2018 වර්ෂවල ගිණුම්, 2020 වර්ෂයේදී සකස් කිරීම හේතුවෙන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කාල පමාවකින් තොරව ගිණුම් ඉදිරිපත් කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.41,593,654 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.41,905,243 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.311,589 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආයෝජන පොලී ආදායම රු.3,227,068 කින් වැඩි වුවද සනීපාරක්ෂක කටයුතු සඳහා මූල්‍යාධාර සැපයීමේ වැඩසටහන සඳහා රු.3,000,000 ක මුදලක් වැය කිරීම සහ වෙනත් වියදම් රු.619,589 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී රු.55,366,914 ක් අරමුදලේ ආදායම් ලෙස ලැබී තිබුණ ද එයින් රු.13,773,260 ක් එනම් සියයට 25 ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැයකර තිබුණි. තවද, වාර්ෂිකව අතිරික්ත වන මුදල් ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ආයෝජන වටිනාකම රු.531,760,164 ක් විය. බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය කාර්යයන් සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි. | 2018 වර්ෂයේ පොලී ප්‍රතිශතය මත ලැබූ පොලී ආදායම ඉහළ වුවත් 2018 වර්ෂයේ අරමුදලේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතීන් සංඛ්‍යාව හා නිලධාරීන් සංඛ්‍යාව පහළ අගයක් විය. නමුත් 2019,2020 සහ 2021 වර්ෂවල අරමුදලේ ව්‍යාපෘතිවල වර්ධනයක් සිදු වී ඇත. | අරමුදලේ කාර්යභාරය ඉටු කිරීමට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව. |